# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2186/40 - 2020 ජූලි මස 31 වැනි සිකුරාදා - 2020.07.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය - සී. අයි../1823

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

එක් පාර්ශවයක් වශයෙන් කොළඹ 05, නාරාහේන්පිට, නාවල පාර, අංක 215 හි පිහිටා ඇති ලංකා ටයිල්ස් පී. එල්. සී. සහ අනෙක් පාර්ශවය වශයෙන් තලංගම. කොස්වත්ත, සෙත්සිරි මාවත, අංක 259/9 හි පිහිටා ඇති අන්තර් සමාගම් සේවක සංගමය අතර 2020 පෙබරවාරි මස 10 වන දින ඇතිකරගන්නා ලද සාමූහික ගිවිසුම් පත්‍රය ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය වන (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) කාර්මික ආරාවුල් පනතේ 06 වන වගන්තිය අනුව මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ජූලි මස 10 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දීය.

1A - G 32609 – 24 (2020/07)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2020 අංක 08 දරන සාමුහික ගිවිසුම

මෙහි මින් මතු "සේව්‍යයා" යනුවෙන් සඳහන් කරනු ලබන කොළඹ 05, නාරාහේන්පිට, නාවල පාර, අංක 215 දරන ස්ථානයෙහි ලියාපදිංචි කළ කාර්යාලය පවත්වාගෙන යනු ලබන, නියමිත පරිදි සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද සමාගමක් වන ලංකා ටයිල්ස් පී. එල්. සී. සමාගම සහ මෙහි මින් මතුවට " සමිතිය " යනුවෙන් සඳහන් කරනු ලබන අංක 259/79, සෙත්සිරි මාවත, කොස්වත්ත, තලංගම දරන ස්ථානයෙහි ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකාවේ කම්කරු දෙපාර්තමේන්තුවේ නියමිත පරිදි ලියාපදිංචි කළ වෘත්තීය සමිතියක් වන අන්තර් සමාගම් සේවක සමිතිය සමග ඇතිකරගත් සාමුහික ගිවිසුමයි.

තවද සමිතිය "සේව්‍යයා" විසින් සේවයේ යොදවන ලද සිය සාමාජිකයන්ගේ සහ අනෙකුත් සමාන ශ්‍රේණි වලට අයත් සේවා නියුක්තිකයින් මේ මගින් ආවරණය වේ. නිත්‍යකාලීන සහ අනියම් සේවා ගිවිසුම මත සේවය කරන සේවා නියුක්තිකයින් මෙම ගිවිසුම මගින් ආවරණය නොවේ. මෙම ගිවිසුම මගින් ආවරණය වන සේවා නියුක්තිකයින්ගේ මෙහි පහත දැක්වෙන සේවා කොන්දේසි සහ තත්ත්වයන් අනුව කටයුතු කිරීමට දෙපාර්ශ්වය බැඳී සිටී.

**01. ගිවිසුම ක්‍රියාත්මක වීම බලපැවැත්වෙන දිනය**

මෙම ගිවිසුම 2019 ජුනි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන අතර දෙපාර්ශ්වයෙන් එක් පාර්ශ්වයක් අනෙක් පාර්ශ්වයට මසක ලිඛිත දැනුම්දීමකින් මෙම ගිවිසුම සමාප්ත කළ හැකි වනු ඇත. එතකුදු වුවත් කිසිදු පාර්ශ්වයක් විසින් වර්ෂ 2022 මැයි 31 වන දිනට ප්‍රථම එවැනි දැනුම්දීමක් සිදු නොකිරීමට බැඳී සිටී. ඉහත 2022 මැයි 31 වන දිනයෙන් අනතුරුව යම් පාර්ශ්වයක් විසින් මෙම ගිවිසුම අවසන් කරනු නොලැබුවහොත් මෙම ගිවිසුම සමාප්තියට පත්නොවී නොකඩවාම බලපැවැත්වෙනු ඇත.

**02. වේතන වැඩිවීම**

මෙම ගිවිසුම මගින් ආවරණය වන 2019 ජුනි මස 01 වන දිනට ප්‍රථම ස්ථිර සේවා පත්වීම් ලැබූ හා දැනට සේවයේ යෙදී සිටින සියලුම ස්ථිර සේවා නියුක්තිකයින්ට ඉහත වර්ෂ 03ක කාලය තුළ රු. 9,750/-ක වේතන වැඩි කිරීමක් පමණක් පහත සඳහන් ආකාරයෙන් වැඩි කිරීමට සේව්‍යයා බැඳී සිටී.

1. 01 වන වසර සඳහා රු. 3,400/- එනම් 2019 ජුනි මස 01 වන දින සිට
11. 02 වන වසර සඳහා රු. 3,750/- එනම් 2020 ජුනි මස 01 වන දින සිට
111. 03 වන වසර සඳහා රු. 2,600-- එනම් 2021 ජුනි මස 01 වන දින සිට

Iv. මෙම ගිවිසුම බලාත්මක වන කාලපරිච්ඡේදය තුළදී රජය යම් ලිඛිත නීතියක් මගින් වේතන වැඩිවීමක් සිදුකරනු ලැබේ නම් හා එම වැඩිවීම් මෙම ගිවිසුම මගින් වාර්ෂිකව ගෙවීමට එකග වී ඇති වැටුප් වැඩිකිරීමට වඩා වැඩි අගයක් ගනු ලබන්නේ නම් ගිවිසුම මගින් එකඟ වී ඇති වැඩිවීම් සහ රජය මගින් නීතිමය ප්‍රතිපාදන මගින් කරන ලද වැටුප් වැඩිවීම අතර වෙනස පමණක් ගෙවීමට සේව්‍යයා බැඳී සිටී.

**03. වාර්ෂික වැටුප් වර්ධක**

මෙකී ගිවිසුම ක්‍රියාත්මක වන 2019 ජූලි මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පහත සඳහන් ආකාරයෙන් වැටුප් වර්ධක රු. 50/-කින් වැඩි කිරීමට සේව්‍යයා එකග වේ.

දැනට පවත්නා රු. 150/- වැටුප් වර්ධකය රු. 200/- දක්වාත්
දැනට පවත්නා රු. 200/- වැටුප් වර්ධකය රු. 250.- දක්වාත්
දැනට පවත්නා රු. 250/- වැටුප් වර්ධකය රු. 300/- දක්වාත් වැඩි කෙරේ.

1. මෙම ගිවිසුමෙහි අංක 02 සහ 03 ඡේද යටතේ දක්වා ඇති වැටුප් වැඩිවීම සහ වැටුප් වර්ධක එහි දක්වා ඇති කාල ක්‍රමානුගතව වැටුපට එකතු කොට ලැබෙන වැටුපෙහි අගය සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් ගණනය සඳහා අදාළ කර ගැනීමට සමාගම එකග වේ.

**04. පැමිණීමේ දිරි දීමනාව**

ගිවිසුම මගින් ආවරණය වන සේවා නියුක්තිකයින්ට දැනට දෙනු ලබන රු. 3000/-ක පැමිණීමේ දිරි දීමනාවට රු. 750/-ක් පහත කොන්දේසිවලට යටත්ව ගෙවීමට සේව්‍යයා එකඟ වේ. ඒ අනුව වැඩිකළ රු. 750/-න් රු. 375/-ක් 100%ක් පැමිණීම වාර්තා කරන සේවා නියුක්තිකයන්ට ගෙවීමට සේව්‍යයා බැඳී සිටී.

1. වැඩි කළ රු. 750/-න් රු. 375/-ක මුදලක් පෙර ගෙවන ලද රු. 3,000/- ද සමඟ රු. 3,375/-ක් පහත මානයන්ට අදාළව ගෙවනු ලැබේ. වැඩි කළ රු. 750/-න් රු. 375/- 100%ක් පැමිණීම වාර්තා කරන සේවා නියුක්තිකයන්ට ගෙවීමට සේව්‍යයා බැඳී සිටී.

- 100% පැමිණීමේ උපමාණය ලඟාකර ගත්තේ නම්
  රු. 3,375/-+375/- =3,750

- 75% පැමිණීමේ උපමාණය ලඟාකර ගත්තේ නම්
  රු. 3,375/-න්75% =2,531.25

- 50% පැමිණීමේ උපමාණය ලඟාකර ගත්තේ නම්
  රු. 3,375/-න්50% =1,687.50

11. **රියදුරු මහතුන් සඳහා**

4. රියදුරු මහතුන් සඳහා දැනට ගෙවනු ලබන රු. 2,250/-ක මුදලට පැමිණීමේ දිරි දීමනාවට රු. 750/-ක් එකතුකොට රියදුරු මහතුන් සඳහා රු. 3,000/-ක මුදලක් පහත සඳහන් උපමානයන්ට යටත්ව ගෙවනු ලැබේ. වැඩිකළ රු. 750/-න් රු. 375/-ක් 100%ක් පැමිණීම වාර්තා කරන රියදුරු මහතුන් සඳහා ගෙවීමට සේව්‍යයා බැඳී සිටී.

- 100% පැමිණීමේ උපමාණය ලඟාකර ගත්තේ නම්
  රු. 2,625/-+375/- =3,000

- 75% පැමිණීමේ උපමාණය ලඟාකර ගත්තේ නම්
  රු. 2,625/-න් 75% =1,968.75

- 50% පැමිණීමේ උපමාණය ලඟාකර ගත්තේ නම්
  රු. 2,625/-න් 50% =1,312.50

111. කාර්යාල කාර්ය සේවක මහතුන් සඳහා දැනට ගෙවනු ලබන රු. 1,875/-ක මුදලට රු. 750/-ක මුදලක් එකතු කොට රු. 2,625/- පැමිණීමේ දිරි දීමනාවක් පහත සඳහන් උපමානයන්ට යටත්ව ගෙවනු ලැබේ. වැඩිකළ රු. 750/-න් රු. 375/-ක් 100%ක් පැමිණීම වාර්තා කරන කාර්යාල කාර්ය සහායක මහතුන් සඳහා ගෙවීමට සේව්‍යයා බැඳී සිටී.

මෙම පැමිණීමේ දීමනාව 2019.06.01 දින සිට ක්‍රියාත්මක කිරීමට එකඟ වේ.

- 100% පැමිණීමේ උපමාණය ලඟාකර ගත්තේ නම්
  රු. 2,250/-+375/- =2,625/-

- 75% පැමිණීමේ උපමාණය ලඟාකර ගත්තේ නම්
  රු. 2,250/-න් 75% =1,687.50

- 50% පැමිණීමේ උපමාණය ලඟාකර ගත්තේ නම්
  රු. 2,250/-න් 50% =1,125/-

මෙම පැමිණීමේ දීමනාව 2019.06.01 දින සිට ක්‍රියාත්මක කිරීමට එකඟ වේ.

05. 1. සාමාන්‍ය රාත්‍රී සේවා මුරයක් සඳහා රු. 200/-ක් වශයෙන්ද,

11. රාත්‍රියේ අතිකාල සේවා මුරයක් සඳහා දැනට ගෙවනු ලබන රු. 300/- වෙනුවට රු. 400/-ක් ගෙවීමට සේව්‍යයා බැඳී සිටී.

මෙම සේවාමුර දීමනාව 2019.06.01 දින සිට ක්‍රියාත්මක කිරීමට එකඟ වේ.

06. අන්තර් සමාගම් සේවක සංගමය සහ සමාගම අතර පවතින සාමූහික ගිවිසුම මගින් සහ වර්තමානයේ තිබෙන සේවා කොන්දේසි වලට අනුව ආයතනයට බලපාන පිඟන් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්ත පඩිපාලක සභා කොන්දේසි වලට වඩා යහපත් තත්ත්වයන් හා වැඩි මුල්‍යමය කොන්දේසි සහ ප්‍රතිලාභ තම සාමාජිකයින්ට ලැබෙන බව වෘත්තීය සමිතිය එකඟ වී පිළිගනියි.

7. **ආරවුල් බේරුම් කිරීමේ පටිපාටිය**

"සමිතිය" පහත දැක්වෙන ආරාවුල් බේරුම් කිරීමේ පටිපාටියට එකඟත්වය පලකර සිටී.

(අ) යම් දිනෙක ආරවුලක් ඇති අවස්ථාවක "සමිතියෙහි" ශාඛා කමිටුව විසින් සේව්‍යයා වෙත ආරවුල පිළිබඳ ලිඛිත ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු වන අතර සේව්‍යයාට එම ආරවුල බේරුම් කිරීම සඳහා අඩුම තරමින් සති දෙකක කාලයක් ලබා දිය යුතුය.

(ආ) සතුටුදායක විසඳුමක් ලබා නොදුනහොත් එම කාරණය ප්‍රධාන වෘත්තීය සමිතියට සහ ලංකා සේව්‍යය සම්මේලනයට (EFC) එකී ආරවුල විසඳීම සඳහා පියවර ගැනීමට යොමු කළ යුතුය.

(ඇ) සාකච්ඡා වලින් අනතුරුව ලංකා සේව්‍ය සම්මේලනයේ සහ ප්‍රධාන වෘත්තීය සමිතියෙහි මැදිහත්වීමෙන් එම කරුණ නිරාකරණය කර ගැනිමට අපොහොසක් වූ කල්හි කම්කරු ආරවුල් පනත යටතේ දැක්වෙන ආරවුල් විසඳීමේ ක්‍රියාපිළිවෙත අනුගමනය කළ යුතුය.

(ඈ) කම්කරු දෙපාර්තමේන්තුවෙහි පැවැත්වෙන ආරවුල් විසඳීමේ ක්‍රියාවලිය අසාර්ථක වූ කල්හි සමිතිය වෘත්තීය සමිති ක්‍රියා මාර්ග වලට අවතීර්ණ වීමට තීරණය කර ඇති නම් එවැනි වෘත්තීය සමිති ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සේව්‍යයාට සහ ලංකා සේව්‍යය සම්මේලනයට (EFC) සමිතිය විසින් දින 14කට නොඅඩු ලිඛිත දැනුම් දීමක් කළ යුතය.

8. ඉහත ප්‍රකාශිත ආරවුල් විසඳීමේ ක්‍රියා පටිපාටිය නොපිලිපදිනු ලබන්නේ නම් කිසිම දැනුම්දීමකින් තොරව වෘත්තීය සමිතියට සාමාජිකයන්ගේ මුදල් ඔවුන්ගේ වැටුපෙන් අඩුකර යැවීමේ පහසුකම (Check off) අහිමි කිරීමට සේව්‍යයා හා වෘත්තීය සමිතිය එකග වේ.

9. මෙකී ගිවිසුම ක්‍රියාත්මක වන කාලපරිච්ඡේදය තුලදී කිසිදු පාර්ශ්වයක් මෙකී ගිවිසුමෙහි අන්තර්ගත වන කිසිදු කොන්දේසියක් හෝ නියමයක් සංශෝධනය කිරීමට, වෙනස් කිරීමට හෝ ඒ වෙනුවට වෙනත් දේ ඇතුළත් කිරීමට කටයුතු නොකරන බවට "සේව්‍යයා" "සමිතිය" සහ මෙකී ගිවිසුමෙන් ආවරණය වන හා ඉන් බැඳෙන සේවා නියුක්තින් මේ මඟින් බැඳී සිටි. මෙකී ගිවිසුම මඟින් ආවරණය වන හෝ බැඳී සිටින කිසිදු කරුණක් හෝ නියමයක් සම්බන්ධයෙන් "සමිතිය" සහ/ හෝ සේවා නියුක්තින් කිසිදු ආකාරයක හෝ වෘත්තීය සමිති ක්‍රියා මාර්ගයකට එළඹීමට හෝ ඉල්ලුම් කිරීමට හෝ ඉදිරිපත් කිරීමට කටයුතු නොකිරීමටත් බැඳී සිටි.

10. "සමිතිය" සහ සේවා නියුක්තිකයන්ද නිෂ්පාදන ඉලක්ක ලඟාකර ගැනීමට ඔවුන්ගේ පූර්ණ සහයෝගය සහ අනුබලය සියළු කල්හි ලබාදීමටත් කම්හල තුළ කුමන හෝ ස්ථානයකදී සිදු කිරීමට පවරා ඇති සියලුම සේවාශ්‍රිත කටයුතු සේවා නියුක්තින් විසින් ඉෂ්ට කිරීමටත් මෙහිදී එකහව බැඳී සිටින්නේය.

11. මෙකී ගිවිසුම ක්‍රියාත්මක වන කාලය තුලදී මුල්‍යමය ස්වභාවයක් ඇති කිසිදු හෝ ආකාරයක වෙනත් ඉල්ලීමක් ඉදිරිපත් නොකිරීමට සමිතිය හා සේවා නියුක්තින් මෙයින් බැඳී සිටී.

12. මෙකී සාමුහික ගිවිසුම කල් පිරෙන 2022 මැයි 31 දිනට ප්‍රථමයෙන් මාස දෙකකට කලින් මෙකී ගිවිසුම සංශෝධනය සඳහා ලිඛිත යෝජනා ඉදිරිපත් කිරීමටද "සමිතිය" සහ සේවා නියුක්තින් මෙයින් එකගත්වය පලකර සිටී.

ඉහත ප්‍රකාශිත සේවා කොන්දේසි සහ තත්ත්වයන්ට එකගව සහ අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටින බව පිළිගෙන ඉහත පාර්ශ්වයන් 2020ක් වූ පෙබරවාරි මස 10 වන දින රාජගිරිය, පරණ කෝට්ටේ පාර, අංක 385 ජේ 3 දරන ලිපිනයෙහි වූ ලංකා සේව්‍ය සම්මේලනයේදී මෙයට අත්සන් තැබූ බව ප්‍රකාශ කරමි.

..............................................,
ලංකා ටයිල්ස් පී. එල්. සී. හා
එම සමාගම වෙනුවෙන්

නම : මහේන්ද්‍ර ජයසේකර

තනතුර : කළමනාකාර අධ්‍යක්ෂක

සාක්ෂි :

අත්සන :

නම :

තනතුර :

..............................................,
අන්තර් සමාගම් සේවක සමිතිය හා
එම සමිතිය වෙනුවෙන්

නම :

තනතුර :

අත්සන :

නම :

තනතුර :

08-327

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.